## ජාතිය ගොඩනැගීමේ බද්ද
## Nation Building Tax (NBT)

2009 පෙබරවාරි මස 01 දින සිට බලපැවැත්වෙන පරිදි ජාතිය ගොඩනැගීමේ බද්ද පනවන ලදි. මෙම නිබන්ධනය 2009 අංක 09 දරණ ජාතිය ගොඩනැගීමේ බදු පනත සහ 2018 අගෝස්තු 31 දින දක්වා එම පනතට කරන ලද සංශෝධන මත පදනම් වේ.

❖ **ජාතිය ගොඩනැගීමේ බද්ද ගෙවීමට යටත් වන්නේ කවුරුන් ද? (2 වන වගන්තිය)**

(1) ඕනෑම ද්‍රව්‍යයක් (නිදහස් කරන ලද ද්‍රව්‍ය සහ පෞද්ගලික ගමන් මල්ලක අඩංගු භාණ්ඩ නොවන) ශ්‍රී ලංකාවට ආනයනය කරනු ලබන හෝ

(2) නිදහස් ද්‍රව්‍ය හැර ඕනෑම ද්‍රව්‍යයක් නිෂ්පාදනය කිරීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යනු ලබන හෝ

(3) නිෂ්පාදකයා විසින් හැර ඕනෑම ද්‍රව්‍යයක් තොග හා සිල්ලර වෙළඳාම කරනු ලබන හෝ

(4) නිදහස් සේවාවක් නොවන, බැංකු හෝ මූල්‍ය ව්‍යාපාර ඇතුළුව කුමන හෝ වර්ගයක සේවා සැපයීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යනු ලබන,

සෑම පුද්ගලයෙකුම ජාතිය ගොඩනැගීමේ බද්ද ගෙවිය යුතු වේ.

ඕනෑම කාර්තුවක බද්දට යටත් පිරිවැටුම, පහත සීමාවන් ඉක්මවන්නේනම්, ජාතිය ගොඩනැගීමේ බද්ද ගෙවිය යුතු වේ.

- දේශීයව නිෂ්පාදනය කළ කෘෂිකාර්මික නිෂ්පාදනයන් වෙළෙඳපොළ සඳහා සකස් කිරීමේ ව්‍යාපාරයක් සඳහා රු. මිලියන 25 කි.
- අනෙකුත් ව්‍යාපාර සඳහා රු. මිලියන 3 කි.

**සටහන:** ආනයන සඳහා ඉහත සීමාවන් අදාල නොවේ.

❖ **බද්දට යටත් පිරිවැටුම යනු කුමක් ද?**

(1) ආනයනය කරන ඕනෑම ද්‍රව්‍යයක් සඳහා - එකතු කළ අගය මත බද්ද ගණනය කිරීම සඳහා යොදාගන්නා පදනම ම යොදා ගැනේ.

(2) ඕනෑම ද්‍රව්‍යයක් නිෂ්පාදනය කිරීම සඳහා - නිදහස් කරන ලද භාණ්ඩ හැර ශ්‍රී ලංකාවේ නිෂ්පාදනය කරන ලද භාණ්ඩ විකිණීමෙන් ලැබුන හෝ ලැබිය යුතු මුදල.

(3) මූල්‍ය සේවා හැර ඕනෑම සේවාවක් සැපයීම සඳහා - නිදහස් කරන ලද සේවා හැර ඕනෑම සේවාවක් ශ්‍රී ලංකාව තුළ සැපයීම මගින් ලැබුණු හෝ ලැබිය යුතු මුදල.

(4) ඕනෑම ද්‍රව්‍යයක් තොග හා සිල්ලර වෙළඳාම සඳහා - පහත ඒවා **හැර** භාණ්ඩ විකිණීමෙන් එම කාර්තුවේ ලැබිය යුතු වූ මුදල:

   (i) ඖෂධ වර්ග.

   (ii) එහි ආනයනකරු විසින් විකිණීම සඳහා සකස් කිරීම හැර යම් පිරිසැකසුම් කිරීමක් නොකර විකුණන විශේෂ වෙළෙඳ භාණ්ඩ බද්දට යටත්වන ඕනෑම භාණ්ඩයක්.

   (iii) විදේශ ව්‍යවහාර මුදල් මගින් ගෙවීම් ලැබීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුවෙන් අවසරලත් තැනැත්තෙකු විසින් කරනු ලබන මැණික් හා ස්වර්ණාභරණ විකුණුම්.

   (iv) යම් මුද්‍රිත පොතක්.

   (v) අපනයනය කිරීම සඳහා යම් අපනයනකරුවෙකුට විකුණනු ලබන යම් භාණ්ඩයක්.

(vi) යම් නිෂ්පාදකයෙකුගෙන් හෝ නිපදවන්නෙකුගෙන් මිලදී ගනු ලබන නැවුම් කිරි, පලා වර්ග, කුරුඳු හෝ රබර් (ඔට්ටපාලු, ක්‍රේප් රබර් හෝ රබර් ශීට්).

(vii) ඉන්ධන පිරවුම්හලකදී විකුණනු ලබන පෙට්‍රල්, ඩීසල් හෝ භූමිතෙල්.

(viii) විදේශ ව්‍යාවහාර මුදලින් ගෙවීම සඳහා තීරුබදු රහිත සාප්පුවල ඇති යම් භාණ්ඩයක් සිල්ලරට විකිණීම.

(ix) එල්. පී. ගෑස්.

(x) යම් මෝටර් වාහනයක් එහි අයිතිකරු විසින්ම විකුණන විට, එම මෝටර් වාහනය.

(xi) ආනයනකරු විසින්ම විකුණනු ලබන සිගරට්.

(5) එසේම, ආනයන හැර අනෙකුත් බද්දට යටත් පිරිවැටුම ගණනය කිරීමේදී පහත සඳහන් අඩුකිරීම්ද සිදුකළ යුතුය.

(i) දරන ලද බොල් ණය (නමුත් බොල් ණය නැවත අයකර ගත් විට පිරිවැටුමට එකතු කළ යුතුය).

(ii) ගෙවූ එකතුකළ අගය මත බද්ද.

(iii) ආනයන මත ගෙවන ලද නිෂ්පාදන බදු හැර ගෙවන ලද යම් නිෂ්පාදන බද්දක්.

(iv) මුදල් අමාත්‍යවරයා විසින් අනුමත කරන ලද, ජාත්‍යන්තර ඉසව් සම්බන්ධයෙන් අපනයන සංවර්ධන ප්‍රදාන යටතේ ගෙවනු ලැබූ යම් ප්‍රදානයක්.

(v) මුදල් අමාත්‍යවරයා විසින් අනුමත කරන ලද ජාත්‍යන්තර ඉසව් සම්බන්ධයෙන් වන භාණ්ඩ හා සේවා සැපයීම මත වූ පිරිවැටුම.

❖ **අදාල වන බදු අනුපාත මොනවාද?**

(1) බද්දට යටත්වන පිරිවැටුම මත (තොග හා සිල්ලර වෙළඳාම හැර) - 2%.

(2) තොග හෝ සිල්ලර වෙළඳාමෙන් බද්දට යටත් පිරිවැටුම මත:

(a) බෙදාහරින්නෙකුගේ බද්දට යටත් පිරිවැටුමෙන් ¾ ක් - නැත.

(b) බෙදාහරින්නෙකුගේ නොවන බද්දට යටත් පිරිවැටුමෙන් ½ ක් - නැත.

(c) ඉතිරි බද්දට යටත් පිරිවැටුම මත.

❖ **යෙදවුම් බදු බැර ඉල්ලා සිටිය හැක්කේ කාටද?**

නිෂ්පාදකයෙකුට තමා විසින් NBT සඳහා ලියාපදිංචි වූ වෙනත් නිෂ්පාදකයෙකුගෙන් මිලට ගන්නා හෝ තමා විසින්ම ආනයනය කරනු ලබන භාණ්ඩ, NBT සඳහා යටත්වන භාණ්ඩ නිෂ්පාදනය කිරීම සඳහා සම්පූර්ණයෙන් හෝ කොටසක් යොදා ගන්නේනම් එම බද්දට යටත් භාණ්ඩවල වටිනාකමට අනුපාතිකව බදු බැර ඉල්ලා සිටීමට හිමිකම් ඇත.

## ව්‍යතිරික්ත භාණ්ඩ හා සේවා

ව්‍යතිරික්ත භාණ්ඩ හා සේවා ලැයිස්තුවක් පනතේ පළමු ලේඛනයෙහි දක්වා ඇත. ඒවායින් කිපයක් පහත දැක්වේ:

| ව්‍යතිරික්ත භාණ්ඩ | ව්‍යතිරික්ත සේවා |
|---|---|
| • නිෂ්පාදකයා විසින්ම අපනයනය කරනු ලබන යම් භාණ්ඩයක්. | දේශීයව සංවර්ධනය කරන ලද මෘදුකාංග සැපයීම. |
| • පොහොර | වෛද්‍ය සේවා |
| • ඖෂධ වර්ග | ජලය සැපයීම |
| • එල්. පී. ගෑස් | භාණ්ඩ හෝ මගී ප්‍රවාහනය |
| • මුද්‍රිත පොත්, සඟරා | රක්ෂණ නියෝජිත සේවා |

### ❖ බද්ද ගෙවීමට නියමිත දින මොනවාද?

ජාතිය ගොඩනැගීමේ බද්ද මාසික වාරික තුනකින් ස්වනක්සේරු ක්‍රමයට ගෙවිය යුතු වේ. නියමිත දිනයන් පහත දැක්වේ:

| වාරිකය | ගෙවීමට නියමිත දිනය |
|---|---|
| • පළමු වාරිකය | අදාල කාර්තුවේ දෙවන මාසයේ 20 වන දින හෝ ඊට පෙර. |
| • දෙවන වාරිකය | අදාල කාර්තුවේ තෙවන මාසයේ 20 වන දින හෝ ඊට පෙර. |
| • තෙවන වාරිකය | අදාල කාර්තුව අවසානයෙන් පසු එළඹෙන මාසයේ 20 වන දින හෝ ඊට පෙර. |

### ❖ වාර්තාව ඉදිරිපත් කිරීමට නියමිත දිනය කවදා ද?

අදාල කාර්තුව අවසානයේ එළඹෙන මාසයේ 20 වන දින හෝ ඊට පෙර ජාතිය ගොඩනැගීමේ බදු වාර්තාව ඉදිරිපත් කළ යුතුය.

### ❖ බද්ද ගණනය කිරීම:

**උදාහරණ 01:**

**සීමාසහිත සුනෙර (පෞද්ගලික) සමාගම,** ලිපිද්‍රව්‍ය තොග හා සිල්ලර වෙළඳාමේ නිරතව සිටියි. 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ කාර්තුවේ විකුණුම් රු.7,500,000/- කි.

**2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ කාර්තුව සඳහා ජාතිය ගොඩනැගීමේ බදු වගකීම ගණනය කරන්න.**

**උත්තරය:**

| | රු. |
|---|---:|
| බද්දට යටත් පිරිවැටුම | 7,500,000 |
| අඩුකළා 50% | (3,750,000) |
| ඉතිරි බද්දට යටත් පිරිවැටුම | 3,750,000 |
| **ජාතිය ගොඩනැගීමේ බද්ද 2% බැගින්** | **75,000** |

උදාහරණ 02:

**සීමාසහිත සනී (පෞද්ගලික) සමාගම,** ප්‍රසිද්ධ බිස්කට් නිෂ්පාදකයෙකුගේ බෙදාහරින්නෙකු වශයෙන් කටයුතු කරයි. 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ කාර්තුව සඳහා සමාගමේ මුළු විකුණුම් රු.14,500,000/- කි.

**2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ කාර්තුව සඳහා ජාතිය ගොඩනැගීමේ බදු වගකීම ගණනය කරන්න.**

උත්තරය:

| | **රු.** |
|---|---|
| බද්දට යටත් පිරිවැටුම | 14,500,000 |
| අඩුකළා 75% | (10,875,000) |
| ඉතිරි බද්දට යටත් පිරිවැටුම | 3,625,000 |
| **ජාතිය ගොඩනැගීමේ බද්ද 2% බැගින්** | **72,500** |

උදාහරණ 03:

**සීමාසහිත ඩෝරා (පෞද්ගලික) සමාගම,** දේශීය වෙළෙඳපොළ සඳහා මෘදු සෙල්ලම් භාණ්ඩ නිෂ්පාදනය කිරීමේ නිරතව සිටියි. 2018 මාර්තු 31 දිනෙන් අවසන් වූ කාර්තුව සඳහා පිරිවැටුම රු.4,500,000/- කි. සමාගම, ආනයනික අමුද්‍රව්‍ය මත රු.52,000/- ක් NBT ගෙවා තිබේ.

**2018 මාර්තු 31 දිනෙන් අවසන් වූ කාර්තුව සඳහා ගෙවිය යුතු ජාතිය ගොඩනැගීමේ බද්ද ගණනය කරන්න.**

උත්තරය:

| | **රු.** |
|---|---|
| බද්දට යටත් පිරිවැටුම මත - නිෂ්පාදන (4,500,000 x 2%) | 90,000 |
| යෙදවුම් බදු බැර | (52,000) |
| ගෙවිය යුතු ජාතිය ගොඩනැගීමේ බද්ද | 38,000 |

උදාහරණ 04:

**සදර්න් ක්‍රාෆ්ට්** අත්කම් නිෂ්පාදකයෙකි. 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් කාර්තුව සඳහා පහත තොරතුරු සපයා ඇත:

(1) දේශීය සාප්පු සඳහා විකුණුම් රු.7,525,000/- කි.

(2) අපනයන රු.13,975,000/- කි.

(3) අමුද්‍රව්‍ය මත ගෙවූ ජාතිය ගොඩනැගීමේ බද්ද රු.165,000/- කි.

(4) සේවා මත ගෙවූ ජාතිය ගොඩනැගීමේ බද්ද රු.12,000/- කි.

(5) ගෙවූ ජාතිය ගොඩනැගීමේ බදු මාසික වාරික රු.30,000/- කි.

**2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන්වූ කාර්තුව සඳහා ගෙවිය යුතු ජාතිය ගොඩනැගීමේ බද්ද ගණනය කරන්න.**

**උත්තරය:**

| | (රු.) | | (රු.) |
|---|---:|---|---:|
| බද්දට යටත් පිරිවැටුම - දේශීය විකුණුම් | 7,525,000 | 2% | 150,500 |
| - අපනයන | 13,975,000 | නිදහස් | - |
| | 21,500,000 | | - |
| යෙදවුම් බදු බැර: | | | |
| සේවා මත ගෙවූ ජාතිය ගොඩනැගීමේ බද්ද - අඩු කළ නොහැක | | | - |
| අමුද්‍රව්‍ය මත ගෙවූ ජාතිය ගොඩනැගීමේ බද්ද | 165,000 | | |
| බද්දට යටත් නිෂ්පාදන සඳහා ඉඩදෙන ප්‍රමාණය | $\frac{165,000}{21,500,000}$ X 7,525,000 | | (57,750) |
| ගෙවිය යුතු බද්ද | | | 92,750 |
| ගෙවූ මාසික වාරික | | | (30,000) |
| **ගෙවිය යුතු ඉතිරි ජාතිය ගොඩනැගීමේ බද්ද** | | | **62,750** |

**උදාහරණ 05:**

**සීමාසහිත ඒසී ලයිෆ් (පෞද්ගලික) සමාගම,** ඉලෙක්ට්‍රොනික උපකරණ විකිණීමේ නිරත සමාගමකි. ඊට අමතරව, සමාගම අළුත්වැඩියා සේවාවන්ද සපයයි. 2018 මාර්තු 31 දිනෙන් අවසන් වූ කාර්තුව සඳහා පහත සඳහන් තොරතුරු සමාගමේ පොත්වලින් උපුටාගෙන ඇත:

(1) සමාගමේ පිරිවැටුම පහත පරිදි වේ:

සමාගම විසින් නිපදවන ලද භාණ්ඩ විකිණීමෙන් - රු.2,850,000/- කි.

සමාගම ආනයනය කරන ලද භාණ්ඩ විකිණීමෙන් - රු.5,600,000/- කි.

අළුත්වැඩියා සේවාවන් - රු.1,450,000/- කි.

(2) සමාගම විසින් ගෙවන ලද ජාතිය ගොඩනැගීමේ බදු විස්තර පහත පරිදි වේ:

ආනයනිත භාණ්ඩ මත - රු.42,800/- කි.

නිෂ්පාදනයට යොදාගන්නා අමුද්‍රව්‍ය දේශීය මිලට ගැනුම් මත - රු.12,000/- කි.

කාර්යාල වියදම් මත - රු.5,400/- කි.

(3) 2018 මාර්තු 31 දිනෙන් අවසන් වූ කාර්තුව සඳහා මාසික වාරික වශයෙන් රු.50,000/- ක් ගෙවා ඇත.

**2018 මාර්තු 31 දිනෙන් අවසන් වූ කාර්තුව සඳහා ඉතිරි ගෙවිය යුතු ජාතිය ගොඩනැගීමේ බද්ද ගණනය කරන්න.**

**උත්තරය:**

| | (රු.) | | (රු.) |
|---|---|---|---:|
| බද්දට යටත් පිරිවැටුම: | | | |
| නිෂ්පාදනය කළ | 2,850,000 | 2% | 57,000 |
| ආනයනිත | 5,600,000 * (50%) = 2,800,000 | 2% | 56,000 |
| සේවා | 1,450,000 | 2% | 29,000 |
| | | | 142,000 |
| යෙදවුම් බදු බැර: | | | |
| අමුද්‍රව්‍ය මත | | | (12,000) |
| ආනයනිත භාණ්ඩ මත | අඩු කළ නොහැක | | - |
| කාර්යාල වියදම් මත | අඩු කළ නොහැක | | - |
| ගෙවිය යුතු බද්ද | | | 130,000 |
| ගෙවූ මාසික වාරික | | | (50,000) |
| **ගෙවිය යුතු ඉතිරි ජාතිය ගොඩනැගීමේ බද්ද** | | | **80,000** |

-------